සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2018 ජනවාරි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2018-01-21
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*

*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

"2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුව ඕනෑම ප්‍රභවයකින් ඕනෑම කාලපරිච්ඡේදයක් සඳහා ගණනය කරන ලද ශුද්ධ ලාභය හෝ ආදායම, ලාභය හෝ ආදායම යනුවෙන් අදහස් කරනු ලැබේ."

**ඔබ විසින් කළ යුතු දෑ:**

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුව, ආදායම් ප්‍රභවයන් (sources of income) පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සෙනරත්** වාසික පුද්ගලයෙකු වන අතර, ඔහු 2015/16 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම් වාර්තාව නියමිත වේලාවට ඉදිරිපත් කර ඇත. සහකාර කොමසාරිස්වරයා එම වාර්තාව ප්‍රතික්ෂේප කර තක්සේරුවක් නිකුත් කර ඇත. ඔබ **සෙනරත්ගේ** බදු උපදේශකයා වන අතර, **සෙනරත්ගේ** තක්සේරුවට එරෙහිව අභියාචනයක් කිරීමට බලාපොරොත්තු වෙයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

තක්සේරුවට එරෙහිව වලංගු අභියාචනයක් කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි තුනක්(03) **සඳහන් කරන්න**.
(ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත සුනිමල් ෆ්ලෝරා (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ සිටින වාණිජමය වැවිලිකරුවෙකු සහ මල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවෙකු වෙයි. පහත සඳහන් තොරතුරු 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

| | **රු.** |
|---|---|
| මල් විකුණුම් - අපනයන | 17,600,000 |
| මල් විකුණුම් - දේශීය වෙළෙඳපොළට | 72,400,000 |
| කාර්යාල ගෘහභාණ්ඩ විකිණීමෙන් ලද මුදල | 996,000 |
| ස්ථාවර තැන්පතුවකින් ලද පොළී ආදායම | 457,000 |
| | **91,453,000** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව [Economic Service Charge (ESC)] **තක්සේරු කරන්න**. (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රත්තරු ක්‍රීඩා සමාජයේ** ආදායම් ප්‍රකාශනයෙහි උද්ධෘතය පහත පරිදි වේ:

| | **රු.** | **රු.** |
|---|---|---|
| සාමාජික ගාස්තු | 2,165,000 | |
| ස්ථාවර තැන්පතු මත පොලිය (ශුද්ධ) | 224,000 | |
| සාමාජිකයන්ට දුන් ණය සඳහා පොලිය | 146,000 | 2,535,000 |
| ආදායම් බදු සඳහා ඉඩදෙන වියදම් | | (1,894,000) |
| **වියදම ඉක්මවූ ආදායමේ අතිරික්තය** | | **641,000** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා **රත්තරු ක්‍රීඩා සමාජය** විසින් වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද බවට සැලකිය හැකිදැයි **හඳුනා දක්වන්න**.

*(ඔබ විසින් අවශ්‍යකරන ගණනය කිරීම් පෙන්විය යුතුය.)* (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**සීමාසහිත මීරා (පෞද්ගලික) සමාගම,** බෑග් නිෂ්පාදනය කර විකුණන ව්‍යාපාරයක නිරතව සිටින එකතු කළ අගය මත බදු [Value Added Tax (VAT)] සඳහා ලියාපදිංචි සමාගමකි. පහත සඳහන් තොරතුරු 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

(1) විකුණුම් [එකතු කළ අගය මත බදු (VAT) රහිතව]:

| | |
|---|---|
| සෘජු අපනයන (ඇමරිකානු ඩොලර් 1 = රු.150/-) | ඇමරිකානු ඩොලර් 8,000/- |
| සරල එකතු කළ අගය මත බදු (SVAT) සඳහා ලියාපදිංචි වූ දේශීය ගනුදෙනුකරුවන්ට විකුණුම් | රු.758,400/- |
| වෙනත් දේශීය ගනුදෙනුකරුවන්ට විකුණුම් | රු.4,161,600/- |

(2) ගෙවන ලද, එකතුකළ අගය මත යෙදවුම් බදු (Input VAT):

| | රු. |
|---|---|
| ආනයනය කළ අමුද්‍රව්‍ය මත | 364,500 |
| දේශීය මිලදී ගැනුම් මත | 245,500 |

(3) සමාගම, වාරික ගෙවීම් පදනම මත රු.10,000/- ක් කාර්තුව සඳහා ගෙවා ඇත.

(4) SVAT විකුණුම් මත රු.113,760/- ක සරල කරන ලද එකතු කළ අගය මත බදු බැර වවුචර් පත් [Simplified VAT Credit Vouchers (SVCV)] එකතු කරගෙන තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න**. (ලකුණු 08)

(b) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

**සහන් සහ පහන්,** කළමනාකරණ උපදේශන සේවා සැපයීමේ නිරතව සිටින **"බිස්නස් සොලූෂන්ස්"** නම් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෝ වෙති. ලාභා'ලාභ 2 : 1 අනුපාතයට බෙදා ගැනීමට ඔවුහු එකඟ වී සිටිති. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය පහතින් දැක්වේ:

**2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| උපදේශන සේවා | | 21,500,000 |
| ගොඩනැගිල්ල මත කුලී ආදායම | | 120,000 |
| ස්ථාවර තැන්පතු මත පොලී - ශුද්ධ | | 5,520 |
| | | **21,625,520** |
| **වියදම්:** | | |
| හවුල්කරුවන්ට ගෙවූ වැටුප් | | |
| **සහන්** | 250,000 | |
| **පහන්** | 250,000 | |
| සේවක මණ්ඩලයට වැටුප් | 3,567,000 | |
| ගොඩනැගිල්ල සඳහා වරිපනම් | 30,000 | |
| ගිණුම්කරණ ක්ෂය | 48,000 | |
| බදු සඳහා ඉඩදෙන වෙනත් වියදම් | 3,588,000 | (7,733,000) |
| **ශුද්ධ ලාභය** | | **13,892,520** |

**සටහන්:**

(1) 2015 අප්‍රේල් 01 දින රු.400,000/- ක පිරිවැයකට පරිගණකයක් මිලට ගන්නා ලදී. අනෙකුත් සියලු වත්කම් 2016 අප්‍රේල් 01 දිනට බදු අරමුණු සඳහා සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත.

(2) ගොඩනැගිල්ලෙන් භාගයක් වෙනත් තෙවන පාර්ශවයකට කුලියට දී තිබේ. සම්පූර්ණ ගොඩනැගිල්ලේම වරිපනම් ගෙවා ඇත්තේ හවුල් ව්‍යාපාරය විසිනි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2016/17 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න**. (ලකුණු 05)

(b) 2016/17 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ආදායම් බද්ද **ගණනය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) **සිරිමෙවන්** වයස අවුරුදු 58 ක විශ්‍රාමික රජයේ සේවකයෙකි. **සීමාසහිත සුහද (පෞද්ගලික) සමාගමේ** ඔහු සහභාගීවන සෑම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමක් සඳහාම රු.40,000/- ක අධ්‍යක්ෂක ගාස්තුවක් ඔහුට ලැබෙයි. **සීමාසහිත සුහද (පෞද්ගලික) සමාගමේ** සේවකයෙකු ලෙස උපයන විට ගෙවීමේ බදු (PAYE) අරමුණ සඳහා සකසන වැටුප් ලේඛනයේ ඔහුව නොසලකයි. 2016/17 තක්සේරු වර්ෂය තුළදී එවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීම වෙනුවෙන් රු.369,600/- ක (බදු අඩු කළ පසු) අධ්‍යක්ෂක ගාස්තුවක් ඔහුට ලැබී ඇත. එසේම 2016/17 වසර සඳහා රු.92,000/- ක ස්ථාවර තැන්පතු පොලී ආදායමක්ද ඔහුට ලැබී ඇත. එම තක්සේරු වර්ෂය තුළදී රු.720,000/- ක (බදු අඩුකළ පසු) මුදල් ත්‍යාගයක් ලොතරැයියකින් ඔහු දිනා ගෙන තිබුණි.

**ඔබ විසින් කළ යුතු දැ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා **සිරිමෙවන්ගේ** ඉහත එක් එක් ආදායම් ප්‍රභවයෙන් අඩුකළ රඳවාගැනීමේ බද්ද [withholding tax (WHT)] **ගණනය කරන්න.** (ලකුණු 06)

(b) දේශීය ආදායම් පනත යටතේ යම් පුද්ගලයෙකු "දරුවකු" වශයෙන් සලකනු ලැබීමට සම්පූර්ණ කළ යුතු කොන්දේසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## <u>C කොටස</u>

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

වාසික සමාගමක් වන **සීමාසහිත ඇත් (පෞද්ගලික) සමාගම**, දේශීය වෙළෙඳපොළ සඳහා විදුලි උපකරණ නිෂ්පාදනය කර විකිණීමේ නිරතව සිටී.

(1) 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයේ සාරාංශය පහත දැක්වේ:

| | **රු.** |
|---|---|
| විකුණුම් | 246,000,000 |
| විකුණුම් පිරිවැය | (198,040,000) |
| **දළ ලාභය** | **47,960,000** |
| වෙනත් ආදායම් | 2,110,000 |
| පරිපාලන වියදම් | (25,450,000) |
| බෙදාහැරීමේ වියදම් | (9,302,000) |
| මූල්‍ය වියදම් | (3,120,000) |
| **බදු පෙර ලාභය** | **12,198,000** |

(2) වෙනත් ආදායම්වල සාරාංශය පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| ලැයිස්තුගත ණයකර මත පොලී ආදායම | 1,700,000 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | 210,000 |
| පෙර වර්ෂවලදී ලියාහරින ලද සහ බදු අරමුණ සඳහා ඉඩදුන් බොල්ණය වලින් නැවත අයකරගත් බොල් ණය | 200,000 |
| | **2,110,000** |

(3) පරිපාලන වියදම්වල පහත දෑ ඇතුලත් වේ:

- ඊළඟ තක්සේරු වර්ෂය සඳහා (2017/18) ගෙවූ රු.525,000/- ක මාස තුනක කුලී අත්තිකාරමක්, කුලී වියදමෙහි ඇතුලත් වේ.

- 2016/17 තක්සේරු වර්ෂය සඳහා අයකළ ගිණුම්කරණ ක්ෂය රු.4,105,000/- ක් විය.

- වර්ෂය තුලදී සමාගම, සෞඛ්‍ය බලධාරීන්ගේ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම හේතුවෙන් රු.150,000/- ක් දඩ වශයෙන් ගෙවා ඇත.

- වර්ෂය සඳහා පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු.876,000/- කි.

(4) බෙදාහැරීමේ වියදම්හි පහත දෑ ඇතුලත් වේ:

- අනාගත ගැනුම්කරුවන් සමග සාකච්ඡා කිරීම සඳහා තක්සේරු වර්ෂය තුලදී, සමාගමේ විකුණුම් කණ්ඩායමක් යුරෝපයට යවන ලදී. කණ්ඩායම සඳහා මිලට ගත් ගුවන් ටිකට්පත්වල පිරිවැය රු.354,000/- කි. 2015/16 තක්සේරු වර්ෂය සඳහා වෙළඳාමෙන් ලද ව්‍යවස්ථාපිත ආදායම රු.16,900,000/- කි.

- මුළු ප්‍රචාරණ පිරිවැය රු.343,000/- ක් වන අතර ගණකාධිකාරිවරයෙකු බඳවා ගැනීම සඳහා පළකළ පුවත්පත් දැන්වීම සඳහා දැරූ රු.63,000/- ක වියදම ද එහි ඇතුලත් වේ.

- **සීමාසහිත ඇත් (පෞද්ගලික) සමාගම** රු.3,000,000/- ක වටිනාකමක් සහිත මෝටර් ලොරි රථයක් සෞඛ්‍ය අමාත්‍යාංශයට වර්ෂය තුලදී පරිත්‍යාග කර තිබේ.

(5) මූල්‍ය වියදම්වල පහත දෑ ඇතුලත් වේ:

| | **රු.** |
|---|---|
| කල්බදු පොලිය | 325,000 |
| බැංකු අයිරා පොලිය | 428,000 |

(6) 2017 මාර්තු 31 දිනට වත්කම්වල විස්තර පහත දැක්වේ:

| **වත්කම** | **පිරිවැය (රු.)** |
|---|---|
| මෝටර් ලොරිය **(1 වන සටහන)** | 6,500,000 |
| වර්ෂය තුල අත්පත් කරගත් වායු සමීකරණ යන්ත්‍රය | 150,000 |
| ඉදිකරගෙන යන නව ගොඩනැගිල්ලේ පාවිච්චිය සඳහා වර්ෂය තුල අත්පත් කරගත් ගෘහ භාණ්ඩ | 825,000 |
| ඉදිකරගෙන යන ගොඩනැගිල්ල සඳහා දැරූ පිරිවැය **(2 වන සටහන)** | 65,000,000 |

**1 වන සටහන**

අවුරුදු 5 ක කාල පරිච්ඡේදයක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ මෝටර් ලොරියක් 2012 ජනවාරි 01 දින ලබා ගන්නා ලදී. මාසික කල්බදු වාරිකය රු.160,000/- ක් වන අතර, 2016/17 තක්සේරු වර්ෂය තුළදී කල්බදු වාරික 9 ක් ගෙවා තිබේ. රු.6,500,000/- ක පිරිවැය වූ මෙම ලොරිය කල්බදු වත්කම්වලින් සින්නක්කර දේපළ, පිරියත සහ උපකරණවලට මාරුකරන ලදී.

**2 වන සටහන**

**සීමාසහිත ඇත් (පෞද්ගලික) සමාගම** විසින් කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින අතර, එය 2017 නොවැම්බර් අවසන් කිරීමට නියමිත වේ.

**3 වන සටහන**

එක් ලොරි රථයක් වර්ෂය තුළදී රු.1,500,000/- කට විකුණන ලද අතර, එය 2014 ජුනි මාසයේදී රු.2,000,000/- ක පිරිවැයකට මිලදී ගන්නා ලද්දකි. එම ලොරි රථයේ පිරිවැය ඉහත වත්කම්වල ඇතුලත් කර නොමැත.

**4 වන සටහන**

අනෙකුත් වත්කම් මත බදු අරමුණ සඳහා ක්ෂය දීමනාව 2016 අප්‍රේල් 01 දිනට සම්පූර්ණයෙන් ලබාගෙන තිබේ.

(7) විශ්‍රාම ගිය සේවකයින් සඳහා රු.645,000/- ක පාරිතෝෂික වර්ෂය තුළදී ගෙවා ඇත.

(8) ව්‍යාපාරයේ අනෙකුත් සියලු වියදම්, ආදායම් බදු සඳහා ඉඩදෙනු ලැබේ.

(9) 2016/17 තක්සේරු වර්ෂය සඳහා ස්වතක්සේරු පදනම මත ගෙවූ ආදායම් බදු රු.400,000/- කි.

**ඔබ විසින් කළ යුතු දැ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

***සැ.යු:** යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුය.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වරලත් ගණකාධිකාරිවරයෙකු වන **සුදේශ්** වාසික පුද්ගලයෙකු වශයෙන් ආදායම් වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරයි. 2016/17 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **සුදේශ්** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) **සුදේශ්** ප්‍රමුඛ පෙළේ බැංකුවක ප්‍රධාන මූල්‍ය නිලධාරියා ලෙස සේවය කරයි. වර්ෂය තුළදී සේවායෝජක (employer) විසින් සපයන ලද ප්‍රතිලාභයන් පහත දැක්වේ:

- දළ වැටුප - මසකට රු.250,000/- බැගින්.
- වාහන දීමනාව - මසකට රු.60,000/- බැගින්.
- වෛද්‍ය රක්ෂණ වාරිකය - මසකට රු.5,000/- බැගින්.

(2) සමාගම විසින් සපයන ලද කුලී රහිත නිවසක ඔහු වාසය කරන අතර එම නිවස සඳහා මසකට රු.20,000/- බැගින් නිවාස හිමිකරුට සේවායෝජක ගෙවයි. එම නිවසේ වරිපනම් තක්සේරුව රු.100,000/- ක් වන අතර 25% බැගින් වරිපනම්ද සේවායෝජක ගෙවා ඇත.

(3) **සුදේශ්** ඔහුට අයිති නිවස රු.50,000/- ක මාසික කුලියකට කුලියට දී ඇත. නිවසේ වරිපනම් තක්සේරුව රු.200,000/- ක් වන අතර, 30% බැගින් වරිපනම් ගෙවනු ලබයි. මෙම නිවස අළුත්වැඩියා කිරීම සඳහා වර්ෂය තුළදී ඔහු රු.90,000/- ක වියදමක් දරා ඇත.

(4) වර්ෂය තුළදී, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමකින් ඔහුට රු.90,000/- ක ශුද්ධ ලාභාංශයක් ලැබී ඇත.

(5) ඔහු ලංකා බැංකුවේ රු.1,000,000/- ක ස්ථාවර තැන්පතුවක් කර ඇත. බැංකුව වර්ෂය සඳහා 2.5% බැගින් රඳවා ගැනීමේ බදු [Withholding Tax (WHT)] අඩුකළ පසු පොලිය වශයෙන් රු.68,250/- ක් ඔහුගේ ගිණුමට බැර කර තිබේ.

(6) වර්ෂය තුළදී, **සුදේශ්** නිවසක් ඉදිකිරීම සඳහා නිවාස ණයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබා ගත්තේය. ඔහු පොලිය සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම් වශයෙන් පිළිවෙලින් රු.241,000/- ක් සහ රු.200,000/- ක් ගෙවා ඇත.

(7) අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් ආයතනිකමය රැකවරණය සපයන අනුමත පුණ්‍යායතනයකට ඔහු රු.80,000/- ක් පරිත්‍යාග කර ඇත.

(8) වර්ෂය සඳහා අඩුකළ උපයන විට ගෙවීමේ බදු (PAYE) රු.197,600/- ක් විය.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2016/17 තක්සේරු වර්ෂය සඳහා **සුදේශ්ගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**.

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |